*සැ. යු.* — මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2010 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,806 - 2013 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2013.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 978 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 979 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති, ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය

1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1) "අ" ඡේදයේ අර්ථ නිරූපනය අනුව දකුණු පළාත් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂය භාර ගරු චන්දිම රාසපුත්‍ර අමාත්‍යතුමා විසින් (1969 අංක 16, 1981 අංක 27, 1993 අංක 22, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ විස්තර දැක්වෙන නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිවලට අමතර වශයෙන් 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් නිලධාරීන් ලෙස පත් කර තිබේ.

එම්. වයි. එස්. දේශප්‍රිය,
ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහාමාර්ග, ප්‍රවෘත්ති සහ ග්‍රාමීය හා වතුයටිතල
පහසුකම් අමාත්‍යාංශය.

2013 මාර්තු මස 05 වැනි දින.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නිලධාරියාගේ නම* | *නියුක්ත කාර්යාලය* | *පත්කර ඇති පළාත* |
|---|---|---|---|
| 01. | අළුත්පටබැඳිගේ නාලක ප්‍රියන්ත | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 02. | දර්ශන චාමන්ත කලංසූරිය | වැලිවිටිය/දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 03. | දිද්දෙනිපොත මාතරගේ චන්දන උපුල් කුමාර | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය, හම්බන්තොට | දකුණු පළාත |
| 04. | හේවා තොන්ඩිලේගේ බන්දු කුමාර ජයලත් | හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 05. | ජාසිංකන්දගේ ජානක සිරිලාල් දහනායක | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 06. | කොරොට්ටගොඩ ගමගෙයි ඉනෝකා හේමමාලා | ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 07. | කොටගොඩ හෙට්ටිආරච්චිගේ දොන් මින්දික නිශාන්ත ජයසේකර | බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 08. | කංකානම් විතාරණගේ ලාල් රංජිත් | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දකුණු පළාත |
| 09. | වීරසූරිය ආරච්චිගේ සුසන්ත චාමල් | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය, හම්බන්තොට | දකුණු පළාත |

04-348

---

## දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 1992 අංක 04 දරන දකුණු පළාතේ, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ අංක 10 (1) සහ (2) වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි දැක්වෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයට අයත් වැලිපොතේවෙල මාර්ගය (කි. මී. 6.1) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගත් බවට මේ මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

චන්දිමා රාසපුත්‍ර,
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග,
ප්‍රවෘත්ති සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් අමාත්‍ය,
දකුණු පළාත් සභාව.

2013 පෙබරවාරි මස 20 වැනි දින.

04-349

# තනතුරු - ඇබෑර්තු

**ආණ්ඩුකාරවර කාර්යාලය - සබරගමුව පළාත**

සබරගමුව පළාත් සභාවේ දීපව්‍යාප්ත සේවා පුරප්පාඩු

පුරප්පාඩු වන සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවර ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් නොලැබුණහොත් පළමුවැනි පන්තියේ නිලධාරීන්ගේ අයදුම්පත්‍ර සලකා බලනු ලබන බැවින්, පළමුවැනි පන්තියේ නිලධාරීන්ට ද ඒ සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

*බඳවා ගැනීම :*

මෙම කැඳවීම අනුව ලැබෙන අයදුම්පත්‍ර ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලැබේ. ආණ්ඩුකාරවර ලේකම් තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු තෝරා ගැනීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ණ අභිමතය පරිදි සිදු කෙරේ.

ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ පුරප්පාඩුව පිරවීම පිළිබඳව අවසාන තීරණය ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය වනු ඇත.

*අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම :*

ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සඳහා අදාළ නිලධාරීන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු වන සේ තමා විසින්ම සකස් කර ගත් අයදුම්පත්‍රයක් 2013.05.03 දිනට පෙර ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් මේ සඳහා අයදුම් කළ හැකිය.

තැපෑලේ දී නැතිවන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් මෙම ආයතනය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

බන්දුල ඒ. නාගසිංහ,
ආණ්ඩුකාරවර ලේකම්.

ආණ්ඩුකාරවර කාර්යාලය,
සබරගමුව පළාත් සභාව,
පළාත් සභා සංකීර්ණය,
නව නගරය,
රත්නපුර.

04-372

---

**බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

තනතුරු පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත් සභා බලප්‍රදේශය තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අඛණ්ඩ වසර 03 ක කාලය තුළ ස්ථිර පදිංචියක් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | උප වෝර්ඩින් | - | (පුරුෂ) |
| 02. | සහකාර නිවාසාචාර්ය | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 03. | පුහුණු ගුරු | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 04. | නිවාසමාතා | - | (ස්ත්‍රී) |
| 05. | ළමා රැකවල්කරු | - | (පුරුෂ) |
| 06. | සහකාර මේට්‍රන් | - | (ස්ත්‍රී) |
| 07. | රියදුරු | - | (පුරුෂ) |
| 08. | අරක්කැමි | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 09. | මුරකරු | - | (පුරුෂ) |
| 10. | කාර්යාල කාර්ය සහායක | - | (ස්ත්‍රී/පුරුෂ) |
| 11. | සනීපාරක්ෂක කම්කරු | - | (ස්ත්‍රී/පුරුෂ) |

01. *සේවා කොන්දේසි.-*

1.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

1.2 තෝරා ගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ඇත.රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරනු ලැබූ අපේක්ෂකයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු එක් අවුරුදු වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

1.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතු ය.

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස රා.ප.ච 07/2007 මගින් පනවන ලද විධිවිධානවලට ද ඉදිරියේ දී පනවනු ලබන විධිවිධානවලට ද යටත් විය යුතු ය.

02. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල.-* අයදුම්කරුවන් තම අයදුම්පත පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් සකස් කර අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව තමන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යයෙන්ම පිරවිය යුතු ය.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, සෞඛ්‍ය,දේශීය වෛද්‍ය,සමාජ සුබසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත, අංක 175, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ" යන ලිපිනයට 2013.04.23 දිනට පෙර එවිය යුතු ය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ පිළිබඳ වගකීම අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත් අනුව ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ. අංක 01 සිට 07 දක්වා තනතුරු සඳහා පමණක් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබුණ හොත් පත්වීම් බලධාරියා විසින් හෝ පත්වීම් බලධාරියා විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරනු ලැබේ.

04. *ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය.-* අංක 01 සිට අංක 06 දක්වා තනතුරු සඳහා ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වේ. මෙම තනතුරු අතිශයින් සංවේදීව කටයුතු කළ යුතු ළමයින්ගේ චර්යා පාලනයට සෘජුව අදාළ වන තනතුරු වේ. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. පත්වීම් බලධාරියා විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයින් පමණක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන ළමා හිමිකම්/අයිතීන්, ළමයින්ගේ මානසික තත්ත්වය හා රැකවරණය පිළිබඳ අත්දැකීම් හා ගැඹුරු දැනුමක් ඇති තිදෙනෙකුට නො අඩු විද්වත් මණ්ඩලයක් විසින් මෙම තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා ලබා දෙන ලකුණු ප්‍රමාණය හා විභාගයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව බඳවා ගැනීම් කරනු ලැබේ.

05. *සම්මුඛ පරීක්ෂණය.-* අංක 7 සිට අංක 11 දක්වා තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වේ. පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන තිදෙනෙකුට නො අඩු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් විසින් මෙම තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා ලබා දෙන ලකුණු ප්‍රමාණය හා විභාගයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව බඳවා ගැනීම් කරනු ලැබේ.

06. විභාග ගාස්තු රු. 350 කි. මෙම විභාග ගාස්තු පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට අමුණා එවිය යුතු ය. මෙසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලබන අතර, කවර හෝ කරුණක් නිසා විභාගයට පෙනී නොසිටින හෝ අයදුම්පත් ඉවත් කර ගන්නා අයදුම්කරුවන්ට හා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොමැති බව හෙළිවන අයදුම්කරුවන්ට විභාග ගාස්තු සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් වෙනුවෙන් පැවරීමට ද නොහැකි ය.

07. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය විසින් පනවනු ලබන නීතිරීති උල්ලංඝණය කළහොත් එම අපේක්ෂකයින් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඬුවමකට යටත් වේ.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

09. *කායික සුදුසුකම්.-* අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍යය තත්වයකින් යුක්ත විය යුතු ය.

බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

*වෙනත්.-* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

10. *වැටුප් පරිමාණය, වයස් සීමාව හා බඳවා ගැනීමේ සුදුසුකම්.:-*

10.1 තනතුර - උප වෝර්ඩ්න්

*වැටුප් පරිමාණය.-* රු. 13,120-10x145-11x170-10x240-10x320- රු. 22,040 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.
(දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*සුදුසුකම් හා පළපුරුද්ද ඃ*

*අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම හා ඉන් විෂයයන් 05 ක් එක්වර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 04කින් සමත්වීම/නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුන(03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම ;

*පළපුරුද්ද.-* බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථාන වලවසර 03 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

*විභාග විෂයය නිර්දේශය ඃ*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාවය<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | අපේක්ෂකයාගේ භාෂා හැකියාව තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| සාමාන්‍ය දැනීම<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජයීය, සංස්කෘතික, විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

10.2 *තනතුර.- සහකාර නිවාසාචාර්ය*

*වැටුප් පරිමාණය.-* රු. 13,120-10x145-11x170-10x240-10x320-රු. 22,040 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය.
(දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයයන් 06 කින් සමත්ව තිබිම. ඉන් විෂයයන් 05 ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 04කින් සමත්වීම/නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම ;

*සහ*

ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයෙන් පිරිනමනු ලබන සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාව ලබා තිබීම ;

*හෝ*

උපදේශනය පිළිබඳ රජය විසින් පිළිගත් ආයතනයක එක් වසරකට නොඅඩු ඩිප්ලෝමාව ලබා තිබීම.

*විභාග විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාවය<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| සාමාන්‍ය දැනීම<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජයීය, සංස්කෘතික, විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කල ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

10.3 *තනතුර - පුහුණු ගුරු*

*වැටුප් පරිමාණය.-* රු. 13,120-10x145-11x170-10x240-10x320- රු. 22,040 (12වන පියවර) (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයන් 06 කින් සමත් වී තිබීම. ඉන් විෂයන් 05 ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

අ.පො.ස (උ. පෙළ) විභාගය පැරණි නිර්දේශය විෂයයන් 04 කින් හෝ නව නිර්දේශය විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

*සහ*

ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ දෑ අවුරුදු සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම ;

*හෝ*

පුහුණු ගුරු සහතිකය (සිංහල/දෙමළ) ලබා තිබීම.

*විභාග විෂය නිර්දේශය.-*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණ<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | අපේක්ෂකයාගේ භාෂා හැකියාව,තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| සාමාන්‍ය දැනීම<br>කාලය - පැය 01 1/2<br>මුළු ලකුණු - 100 | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජයීය, සංස්කෘතික, විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

*10.4 තනතුර - නිවාසමාතා*

*වැටුප් පරිමාණය.-* රු. 13,120-10x145-11x170-10x240-10x320- රු. 22,040 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*සුදුසුකම් :*

*අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයන් 06 කින් සමත්ව තිබිය යුතු ය. ඉන් විෂයන් 05 ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*පළපුරුද්ද :*

බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථාන වල වර්ෂ 03 කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

*විභාග විෂය නිර්දේශය.-*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය<br>කාලය පැය 01 1/2 | පහත සඳහන් විෂය නිර්දේශය අනුව සකස් කෙරෙන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.<br>▪ ළදරුවන්ට හා ළමුන්ට වැළඳෙන රෝග, සරල ප්‍රථමාධාර, එම රෝග වලක්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍යාරක්ෂණ ක්‍රම.<br>▪ ළදරු හා ළමාවියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හා ආහාර ලබා දීමේ දී අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු.<br>▪ ළදරු හා ළමාවියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම. |

*10.5 තනතුර - ළමා රැකවල්කරු (ඕවර්සියර්)*

*වැටුප් පරිමාණය.-* රු. 13,120-10x145-11x170-10x240-10x320 - රු. 22,040 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතු ය.
(දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

*සුදුසුකම්.-*

*අධ්‍යාපන සුදුසුකම් :* අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයන් 06 කින් සමත්ව තිබිය යුතු ය. ඉන් විෂයන් 05 ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*පළපුරුද්ද.-* බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂකසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානවල වර්ෂ 03 කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.

*විභාග විෂයය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතම හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| සාමාන්‍ය දැනීම<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක, ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

10.6 **තනතුර - සහකාර මේට්‍රන් :**

*වැටුප් පරිමාණය.-* රු.13,120-10x145-11x170-10x240-10x320- රු. 22,040 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - MN 1 - 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

*සුදුසුකම් :*

*අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළත්ව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඕනෑම විෂයයන් 06 කින් සමත්ව තිබීම. ඉන් විෂයයන් 05 ක් එකවර සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම ;

*වෘත්තීමය සුදුසුකම්.-* දෙහිවල බහු තාක්ෂණික ආයතනයේ ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ එක් වසරක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වනු ලබන සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම ;

*හෝ*

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථාන වල වසර 03 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

*විභාග විෂයය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය<br>කාලය - පැය 01<br>මුළු ලකුණු - 100 | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| සාමාන්‍ය දැනීම<br>කාලය - පැය 01 1/2<br>මුළු ලකුණු - 100 | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක, ක්‍රීඩා ක්ෂෙත්‍රයන්හි දේශීය/ විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

10.7 **තනතුර.- රියදුරු - 11 'ආ' පන්තිය**

*වැටුප් පරිමාණය.-*රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 (රා.ප.ච.ලේ. 6/2006 (iv) - PL 3- 2006A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.).

*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

- අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත්වී සිටිය යුතු ය.
- පුද්ගලික/කුලී රථ හා තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය.
- වාහන රියදුරෙකු වශයෙන් වසර 03 පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මඟින් සනාථ කළ යුතු ය.).
- අවම උස අඩි 05 විය යුතු ය.
- දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.
- මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

10.8 **තනතුර - අරක්කැමි**

*වැටුප් පරිමාණය.-*රු.12,210-10x130-10x145-10x160-12x170- 18,600 (රා.ප.ච.ලේ. - 6/2006 (iv) PL - 2-2006 A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.).

*සුදුසුකම් :*

*අධ්‍යාපන සුදුසුකම්.-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරක දී විෂයයන් හයකට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව සමත් වී තිබිය යුතු ය.

*වෘත්තීයමය සුදුසුකම්.-* රජයේ හෝ රජයේ ලියාපදිංචි කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ආහාර පිසීම/සූපවේදය පිළිබඳව තෙමසකට නොඅඩු වෘත්තීය පාඨමාලාවක් හදාරා ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

*පළපුරුද්ද.-* එකවර 20කට නොඅඩු පිරිසකට ආහාර පිසීමේ හැකියාව තිබිය යුතු ය.

10.9 **තනතුර - මුරකරු**

*වැටුප් පරිමාණය.-* රු.11,730-10x120-10x130-10x145-12x160-17,600 (රා.ප.ච.ලේ. - 6/2006 (iv) - PL1-2006 A).

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට වයස් සීමාව අදාළ නොවේ.).

*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගය එක් වරක දී විෂයයන් 06 කට නො අඩුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව සමත් වී තිබිය යුතු ය.

10.10 **තනතුර - කාර්යාල කම්කරු**

*වැටුප් පරිමාණය.-*රු.11,730-10x120-10x130-10x145-12x160-17,600 (රා.ප.ච.ලේ. - 6/2006 (iv) - PL1-2006 A)

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

*අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගය එක් වරක දී විෂයයන් 06 කට නොඅඩුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව සමත් වී තිබිය යුතු ය.

10.11 **තනතුර - සනීපාරක්ෂක කම්කරු**

*වැටුප් පරිමාණය.-* රු.11,730-10x120-10x130-10x145-12x160-17,600 (රා.ප.ච.ලේ. - 6/2006 (iv) - PL1-2006 A).

*වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.).

*අධ්‍යාපන සුදුසුකම් ඃ*

අ.පො.ස. (සා.පෙළ) විභාගය එක් වරක දී විෂයයන් 06 කට නොඅඩුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව සමත් වී තිබිය යුතු ය.

*වෙනත් සුදුසුකම් ඃ*

යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
ඉල්ලුම් කරන දිනට පූර්වාසන්නයේ වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ පදිංචිය තිබිය යුතු ය.

* 2012.05.11 දින ගැසට් පත්‍රයට අනුව කාර්යාල කාර්ය සහායක, සනීපාරක්ෂක කම්කරු, මුරකරු යන තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්කරුවන් ද නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

ලේකම්,
සෞඛ්‍ය දේශීය වෛද්‍ය,සමාජ සුබසාධන,කාන්තා කටයුතු,
පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය,
බස්නාහිර පළාත,

2013 මාර්තු මස 20 වැනි දින,

**ආදර්ශ අයදුම්පත**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ......................................... තනතුර සඳහා අයදුම් පත්‍රය*

(කාර්යාලයීය ප්‍රයෝජනයසඳහා)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :—————.
(ii) සම්පූර්ණ නම :—————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

03. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් නම් ඔහුගේ රාජකාරී ලිපිනය ලිවිය යුතුයි.ලිපිනයේ වෙනසක් ඇත්නම් එය වහාම දැන්විය යුතුයි.)

04. ස්ථිර ලිපිනය හා දුරකථන අංකය :—————.

05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ඃ ☐ පුරුෂ ඃ ☐

07. විවාහක අවිවාහක බව ඃ විවාහක ඃ ☐ අවිවාහක ඃ ☐

08. විභාගයට පෙනී සිටින මාධ්‍යය .- සිංහල/දෙමළ/ඉංග්‍රීසි

09. උපන් දිනය : අවු. :————. මාසය :————. දිනය :————.

(i) 2013.03.01 දිනට වයස ඃ අවු. :————. මාස :————. දින :————.

(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද ? :—————.

09. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්.-*

(i) අ.පො.ස. (සා. පෙළ) :

| *විෂය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| 01. ............................ | ........... | 06. ............................ | .............. |
| 02. ............................ | ........... | 07. ............................ | .............. |
| 03. ............................ | ........... | 08. ............................ | .............. |
| 04. ............................ | ........... | 09. ............................ | .............. |
| 05. ............................ | ........... | 10. ............................ | .............. |

(ii) අ.පො.ස. (උ.පෙළ) :

| *විෂය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| 01. ............................ | ........... | 03. ............................ | .............. |
| 02. ............................ | ........... | 04. ............................ | .............. |

(iii) *ලබා ඇති උපාධිය* :—————.

(iv) උපාධියට හදාරා ඇති විෂයයන් :—————.

(v) උපාධිය වලංගු දිනය :—————.

(vi) උපාධිය ලබාගත් විශ්වවිද්‍යාලය :—————.

10. වෘත්තිය සුදුසුකම් (අදාල වේ නම්) :—————.
11. අනිකුත් සුදුසුකම් :—————.
12. පළපුරුද්ද :—————.
13. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :—————.
14. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය :—————.
15. මුදල් ගෙවූ කාර්යාලය සහ ලදුපත් අංකය :—————.

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන ලෙස අලවන්න. |

16. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

17. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

.................................................................... මයා./මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ...................................... තනතුරේ සේවය කරන බවත් , ඉහත අයදුම්කරන තනතුර සඳහා තෝරා පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

................................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.).

දිනය —————.

2013 මාර්තු මස 20 වැනි දින.

04-403

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.